**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා වූ යෝජනා 2016**

---

ගරු අගමැතිතුමා, ගරු කථානායකතුමා

සහ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන

නියෝජිත කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා වූ යෝජනා

**පූර්විකාව**

ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ආරක්ෂණය වැඩි දියුණු කිරීමට නම්, සම්පාදනය කිරීමට නියමිත නව ආණුඩක්‍රම ව්‍යවස්ථාව තුළ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයකින් හරයාත්මක නීතිය දියුණු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස යි. ඒ සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ දී පහත මානයන් කෙරෙහි අවධානය යොමු කිරීම අතිශය ද වැදගත් වේ;

අ) බලය බෙදීම සම්බන්ධයෙන් සහ සංවරණ හා තුලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වඩාත් සාධනීය ක්‍රම තහවුරු කිරීම

ආ) මහජන ආරක්ෂාව පිළිබඳ නීති මාලාව ශක්තිමත් ලෙස නියාමනය කිරීම

**සුවිශේෂ යෝජනා**

**1) ව්‍යවස්ථාමය මූලධර්මයන්**

මූලික ව්‍යවස්ථාමය මූලධර්මයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පූර්විකාවේ හෝ හරයාත්මක ප්‍රතිපාදනයක් වශයෙන් අනිවාර්යෙන් ම සඳහන් කළ යුතු ය;

- ජනතා ස්වාධිපත්‍යය පාලනයේ පදනම විය යුතු ය
- පාලන ක්‍රමයේ විනිවිදභාවය සහ වගවීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය
- බහුවිධතාවයට ගරු කරමින් සියල්ලන්ගේ මානව ගරුත්වයට හා තනිව හා කණ්ඩායම් වශයෙන් භුක්ති විඳිනා නෛසර්ගික මානව හිමිකම් වලට සමසේ ගරු කිරීම
- සියලු දෙනාගේ ම ආගමික නිදහසට ගරු කිරීම.
- සමාජ යුක්තියට - සාධාරණත්වයට ගරු කිරීම
- බලය බෙදීම
- සියලු ම සත්ව වර්ග ආරක්ෂා කිරිම ඇතුළුව පරිසර සංරක්ෂණය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් අනාගත පරම්පරාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**2) මූලික අයිතිවාසිකම්**

2006 -2009 කාලයේ දී එවක මානව හිමිකම් පිළිබඳ අන්තර් ආමාත්‍ය කමිටුවේ සභාපතිත්වය දැරූ මහින්ද සමරසිංහ අමාත්‍යවරයා විසින් පත් කරන ලද අතිරේක කමිටුව මඟින් මෙම අයිතිවාසිකම් කෙටුම්පත සම්පාදනය කරන ලදී (අමුණා ඇත). පහත සංශෝධනයන්ට සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවලංගු කිරීමේ අවශ්‍යතාවයට යටත්ව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන්නේ ය.

- වෙනස්කමකට භාජන නොකළ යුතු බවට වන ප්‍රතිපාදනය තුළට 'ලිංගික අනන්‍යතාව' යන පදනම ද එකතු කරමින් එය තවදුරටත් ශක්තිමත් කළ යුතු ය. 'ලිංගික හැඩගැස්ම', 'ලිංගික අනන්‍යතාව', 'ආබාධ සහිත බව' යනාදි පදනම් ද ඉහත සඳහන් ප්‍රතිපාදනය තුළට ඇතුළත් විය යුතු බවට විවිධ නියෝජිත කණ්ඩායම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත. ඉහත පළමු හා අන්තිම පදනම් සහ තවත් පදනම් ලෙස 'වයස', 'මාතෘත්වය', යනාදිය මේ වන විටත් කෙටුම්පතට ඇතුළත් කර ඇත. ශ්‍රී ලංකාව එකඟ වී ඇති

අන්තර්ජාතික බැඳීම්වලට අනුකූල වන ආකාරයට (පහත සඳහන්) මෙම ප්‍රතිපාදනය පැහැදිලිව දැක්විය යුතු ය.
'' ..... පදනම් වැනි වෙනත් පදනම් මත කිසිදු වෙනස්කමකට භාජන කිරීමක් සිදු නොකළ යුතු ය''

- බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමෙන් තොරව සිටීමට ඇති අයිතිය පිළිගැනීම
- නීති ආධාර ලැබීමට ඇති අයිතිය හෝ යුක්තිය වෙත ප්‍රවේශ වීමට ඇති පුළුල් අයිතිය පිළිගැනීම
- පොදු ජන ජීවිතයේ විවිධ අංශයන්ගේ දක්නට ඇති ඓතිහාසිකමය වශයෙන් අයුක්තිසහගත තත්ත්වයන්වලට ලක්වූ හා අඩු නියෝජනයක් ලද කණ්ඩායම් උදෙසා හිතකර ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍යයට සක්‍රීය බැඳීමක් ඇති බව දැක්විය යුතු ය.
- මූලික අයිතිවාසිකම් කඩ කිරිම පිළිබඳ පෞද්ගලික පාර්ශ්ව වෙත සුදුසු අවස්ථාවලදි වගකීමක් ඇති කළ යුතු ය.
- යුක්තිය වෙත ප්‍රවේශ වීමට ඇති අයිතිය පහසු කරනු පිණිස මූලික අයිතිවාසිකම් සඳහා වූ අධිකරණ බලය කලාපීය අධිකරණ වෙත විමධ්‍යගත කළ යුතු ය.
- 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත අහෝසි කළ යුතු අතර එහි ඇතුළත් අයිතීන්, සම්පාදනය කිරීමට නියමිත මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ඇතුළත් කළ යුතු ය. මානව හිමිකම් පිළිබඳ කිසිදු ධූරාවලියක් පිළිගත නො යුතුය.
- මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය මඟින් පිළිගෙන ඇති අයිතිවාසිකම් පහසුවෙන් වෙනස් කළ නොහැකි විය යුතු ය. එහි සඳහන් යම් අයිතිවාසිකමක් ඉවත් කිරීමක් හෝ හීන කිරීමක් සිදු කරන්නේ නම් ඒ යෝජනාව ජනමත විචාරණයක් සහ පාර්ලිමේන්තු විශේෂ බහුතරයක් මගින් සම්මත කළ යුතු ය. එයට විකල්පයක් ලෙස, මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි ඇති අයිතිවාසිකම් සංශෝධනය කිරීම වළක්වාලන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය පිළිබඳ සිද්ධාන්තය පිළිගත හැක.
- මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය අර්ථ නිරූපණය කිරීමේ දී මානව ගරුත්වය හා සමාන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය. මෙහි දී අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ සහ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවන මූලධර්මයන් සැලකිල්ලට ගත යුතු ය.

**3) ශක්තිමත් සංවරණ හා තුලන පද්ධතියක් ඇති කිරීම**

- ව්‍යවස්ථාදායක සභාවේ බහුතර සාමාජිකයන් දේශපාලන නියෝජිතයන් නොවී ගෞරවනීය පුරවැසියන්ගෙන් සමන්විත විය යුතු ය. සමාජ විවිධත්වය ව්‍යවස්ථාදායක සභාව තුළ නිරූපණය විය යුතු ය.
- අධිකරණයේ ස්වාධීනත්වය ඉහළ නැංවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව ශක්තිමත් කළ යුතු ය. අධිකරණ සේවා කොමිසම විශ්‍රාමලත් ගෞරවනීය විනිසුරුවරුන්, රජයේ හා රජයේ නොවන නීතිඥයන් සහ විද්‍යාර්ථීන්ගෙන් සමන්විත විය යුතු ය.
- විනිසුරුවරුන් ධූරයෙන් ඉවත් කිරීම සඳහා ස්වාභාවික යුක්ති මූලධර්ම මත සම්පාදනය වූ සුවිශේෂී ක්‍රියාපටිපාටියක් ව්‍යවස්ථාපිත නීතියක් ලෙස සකස් කළ යුතු ය.
- ව්‍යවස්ථා සමාලෝචනයට ඇති අධිකරණ බලය තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ. සමාලෝචන බලය අනාගතයට බලපාන පරිදි පැවතිය යුතු අතර පූර්ව ව්‍යවස්ථා සමාලෝචනය තවදුරටත් රඳවා තබා ගත යුතු ය.

**4) මහජන ආරක්ෂාව පිළිබඳ නීති පද්ධතිය**

- ශ්‍රී ලංකාව බැඳී සිටින අන්තර්ජාතික මානව හිමිකම් එකඟතාවන්ට අනිවාර්යෙන් ම අනුකූල විය යුතු ය.

- රාජ්‍යය තුළ හදිසි තත්ත්වයන් ප්‍රකාශයට පත් කළ හැක්කේ ජන ජීවිතයේ පැවැත්මට තර්ජනයක් වන අවස්ථාවල දී පමණි.
- රාජ්‍ය තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ විට ඒ පිළිබඳව අධිකරණ සමාලෝචනයට ඉඩ ලබා දිය යුතු ය.
- ඒ ආකාරයෙන් ම හදිසි නීති රෙගුලාසි සහ හදිසි නීති විධාන සමාලෝචනයට ද අධිකරණයට ඇති බලය සහතික කළ යුතු ය.
- හදිසි තත්ත්වය මාස හයකට වඩා වැඩි කාලයක් නොකඩවා ක්‍රියාත්මක වන අවස්ථාවක එහි කාලය දීර්ඝ කිරීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයක් අවශ්‍ය වන්නේ ය.
- හදිසි තත්ත්වයන් ඇති කාලච්ඡේදයක දී මූලික අයිතිවාසිකම්වල අගය හීන කිරීමක් පිළිබඳව ඉහත මූලික අයිතිවාසිකම් කෙටුම්පතෙහි සඳහන් කොට ඇති ප්‍රතිපාදන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අනුමත කරයි.

**5) අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන්**

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල අනුව මානව හිමිකම් සම්මුතීන් අපරානුමතකරණය සඳහා ක්‍රමවේදයක් සාකච්ඡා කිරීමට යෝජනා කරන අතර එය වෙනත් සම්මුතීන් කෙරෙහිද ආදේශ කළ හැකි ක්‍රමවේදයක් බව කොමිෂන් සභාව පිළිගනු ලබයි.
- අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන් අපරානුමතකරණය සඳහා වූ තම චේතනාව පාර්ලිමේන්තුව වෙත දැන්වීම විධායකය විසින් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එවැනි අපරානුමතකරණයක් යෝජනාවක් මඟින් සම්මත කළ යුතු ය. මෙවැනි යෝජනාවක් සම්මත කරගැනීම තුළින් පාර්ලිමේන්තුවේ අරමුණ වන්නේ පසුකාලීනව මෙය දේශීය හැකිකරවන නීතියක් ලෙස සම්මත කිරීමට අපේක්ෂා කරන බව යැයි තහවුරු කළ යුතුය.
- අපරානුමතකරයෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත එකී සම්මුතියට අදාළ නීති සම්පාදානය (හැකිකරවන ව්‍යවස්ථාවක්) සඳහා ආණ්ඩුව බැඳී සිටිය යුතු ය. එසේ වූ නීතියක් (හැකිකරවන ව්‍යවස්ථාවක්) වසරක කාලයක් ඇතුළත අපරානුමතකරණය කිරීම සිදු නොකළහොත් අපරානුමතකරණය කරන ලද සම්මුතියෙහි ඇති හරයාත්මක අයිතීන් පිළිගැනීම සඳහා අධිකරණයට අධිකරණ බලය ලබා දිය යුතු ය.

**6. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

- 1996 අංක 21 දරන පනතින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවා ඇත. කෙසේ වුව ද කොමසාරිස්වරුන් පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ 1978 ආණ්ඩුකම ව්‍යවස්ථවට ගෙන ආ 19 වන සංශෝධනය යි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (අනෙක් කොමිෂන් සභා මෙන්) අනාගත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිහිටවූ ව්‍යවස්ථානුකූල ආයතනයක් වශයෙන් හඳුනාගත යුතු බවට නිර්දේශ කරයි. එහි බලතල සහ කාර්යයන් මෙන් ම කොමිෂන් සභාවේ නිර්දේශයන් සමඟ එකඟ වීමට මහජන ආයතනයන්ට ඇති යුතුකම ද ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාව තුළින් නියම කළ යුතු ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එහි වර්තමාන නෛතික රාමුව, වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා, අධ්‍යයනය කරමින් සිටී.

**7) භාෂාමය ප්‍රවේශය**

- අනාගත ආණුඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ දී සහ පරිවර්තනය කිරීමේ දී පුරවැසියන්ට එය පහසුවෙන් කියවා ප්‍රතිපාදනයන් වෙත ඉක්මනින් ප්‍රවේශ විය හැකි සරල භාෂාවක් භාවිතා කළ යුතු බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණයෙන් යුතුව නිර්දේශ කරයි. තමන්ගේ මූලික නීතිය මඟින් පැවසෙන්නේ කුමක් ද යන්න දැනගැනීම

පුරවැසියන් සතු අයිතියකි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පාලනයේ සුජාතබව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි ජනතා විශ්වාසය තහවුරු කිරීමේදි මූලික වැදගත්කමක් දරයි.

## අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පත

පහත අමුණා ඇති අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පත නිර්දේශිත සංශෝධනයන්ට යටත්ව හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙත ඇති යොමු කිරීම් ඉවත් කොට අනාගත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ඇතුළත් කළ හැකි බවට මානව හිමිකම් කොමිෂන් සභාව අනුමත කරයි.

2006 -2009 කාලයේ දී එවක මානව හිමිකම් පිළිබඳ අන්තර් ආමාත්‍ය කමිටුවේ සභාපතිත්වය දැරූ මහින්ද සමරසිංහ අමාත්‍යවරයා විසින් පත් කරන ලද අතිරේක කමිටුව මඟින් මෙම අයිතිවාසිකම් කෙටුම්පත සම්පාදනය කරන ලදී. එම කමිටුව මානව හිමිකම් පිළිබඳ ප්‍රවීණ ශාස්ත්‍රවේදීන්, සිවිල් සමාජ නීතිවේදීන්, නීතිඥයින් සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගෙන් සමන්විත විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වර්තමාන සභාපතිනිය වන ආචාර්ය දීපිකා උඩගම මහත්මිය ද මෙම කමිටුවේ සාමාජිකාවක් වශයෙන් කටයුතු කළ අතර ඇය ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටුවේ සභාපතිනිය වශයෙන් ද කටයුතු කළේය. ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා මෙම කමිටුවේ සභාපති ධූරය හෙබ විය.

කමිටුව ශ්‍රී ලංකාව සතු අන්තර්ජාතික මානව හිමිකම් බැඳීම් මෙන් ම ඉන්දීය සහ දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුලනාත්මකව සලකා බලමින් මෙම අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පතේ රාමුව හා හරයාත්මක ප්‍රතිපාදන සාකච්ඡා කොට ඇත.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ වූ 18 වැනි සංශෝධනය ලෙස මෙම අයිතිවාසිකම් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අදහස් කරන ලදී. ශ්‍රී ලංකාවේ වසර 26ක් පැවති සිවිල් යුද්ධය 2009 වසරේ දී අවසාන වීම මෙම කෙටුම්පත මහජන විචාරය සඳහා නිකුත් කිරීමට සහ අවසානාත්මක පිළිගැනීමක් උදෙසාවූ කාලෝචිත මෙහොතක් වුනි. කෙසේ වුව ද, කෙටුම්පත නිල වශයෙන් මහජන කථිකාවතක් සඳහා පොදු ජනතාව වෙත නිකුත් නොකළ අතර එය පාර්ලිමේන්තුව සම්මත කළේ ද නැත.

**අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පත**

10 සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමික නිදහස

10 (අ) මානව ගරුත්වයට ඇති අයිතිය

10 (ආ) ජීවිතයට ඇති සහජ අයිතිය

10 (ඇ) නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීමට ඇති අයිතිය

11 වධහිංසනයෙන් නිදහස

11 (අ) පුද්ගලයාගේ ආරක්ෂාව

12 සමානාත්මතාවයේ අයිතිය සහ වෙනස් කොට සලකනු ලැබීමෙන් නිදහස් වීම

13 අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීමෙන්, රඳවා තැබීමෙන්, දඬුවම් කිරීමෙන් සහ පූර්වකාරී දණ්ඩන ව්‍යවස්ථා පැනවීමෙන් නිදහස්ව සිටීමේ අයිතිය

14 මතවාදයන් දැරීමේ නිදහස

14 (අ) තොරතුරු දැනගැනීමේ නිදහස හා ප්‍රකාශයට පත් කිරීමේ නිදහස ඇතුළත්ව භාෂණයේ සහ අදහස් ප්‍රකාශනයේ නිදහස

14 (ආ) තොරතුරු දැනගැනීම සඳහා ප්‍රවේශ වීමේ නිදහස

14 (ඇ) සාමකාමී ලෙස රැස්වීමේ නිදහස

14 (ඈ) සමාගමයේ නිදහස

14 (ඉ) වෘත්තීය සමිති අයිතිවාසිකම්

14 (ඊ) ආගමක් ප්‍රවර්ධනය කිරීමට ඇති නිදහස

14 (උ) භාෂා භාවිතා කිරීමේ, සංස්කෘතිය භුක්ති විඳීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ නිදහස

14 (ඌ) ඕනෑම නීත්‍යානුකූල වෙළඳාමක, රැකියාවක, වෘත්තියක, ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නිරත වීමේ නිදහස

14 (එ) සංචලනය වීමේ නිදහස

14 (ඒ) ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේ නිදහස

14 (ඔ)(පවුල් ජීවිතයට හා පෞද්ගලිකත්වයට ඇති අයිතිය

14 (ඕ) දේපළ හිමිකම් දැරීමට ඇති අයිතිය

14 (ක) පවුල් අයිතිවාසිකම්

14 (ග) ළමා අයිතිවාසිකම්

14 (ජ) අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම්

14 (ට) සූරා කෑමෙන් වැළකීමේ නිදහස

14 (ඩ) කම්කරු අයිතිවාසිකම්

14 (ණ) සෞඛ්‍යයට ඇති අයිතිවාසිකම

14 (ත) සමාජීය අයිතිවාසිකම්

14 (ද) යෝග්‍ය පරිසරයකට ඇති අයිතිය

14 (න) මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට හා ඒවාට ගෞරව කිරීමට රාජ්‍යයට ඇති වගකීම

15 මහජන හදිසි අවස්ථාවන්හි දී මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම

16 ලිඛිත හා අලිඛිත නීති පැවතීම

17 රාජ්‍ය ක්‍රියාවක් මඟින් සිදුවන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක දී ප්‍රතිකර්ම සැලසීම

17(අ) නීත්‍යානුකූලව සහ ස්ථිර ලෙස පදිංචි පුරවැසියන් නොවන පුද්ගලයන්ගේ අයිතිවාසිකම්

17 (ආ) මූලික අයිතිවාසිකම් ප්‍රතිපාදන සහ භාෂා අයිතිවාසිකම් ප්‍රතිපාදන අර්ථ නිරූපණය කිරීම

35 ජනාධිපති විනිර්මුක්තිය

126 මූලික අයිතිවාසිකම් ප්‍රතිපාදන සහ භාෂා අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය සහ එහි ක්‍රියාකාරීත්වය